


# සිංහල

## 4 ශ්‍රේණිය

Start Your Learning Journey with e-thaksalawa
The National e-learning Portal for The General Education

# 20 පාඩම

## ස,ශ,ෂ යෙදුණු වචන තෝරමු.

ක්‍රියාකාරකම 1

- අපි දැන් මෙම අක්ෂර තුන හඳුනා ගනිමු.

| | |
|---|---|
| ස | දන්තජ “ස” |
| ශ | තාලුජ “ශ” |
| ෂ | මූර්ධජ “ෂ” |

- පහත ඡේද ශබ්ද නගා කියවමු.
- එහි ඇති ස,ශ,ෂ යෙදුණු වචන කැමති පාට තුනකින් රවුම් කරමු.

උදාහරණ -

ස - එක පාටකින්

ශ - තවත් පාටකින්

ෂ - තවත් පාටකින්

**නැවත එම වචන කියවමු.**

සරුවට වැඩී නිල් පැහැයෙන් ශෝභමාන වූ කෙත කහ පැහැයට හැරෙන්නට පටන් ගත්තේ ගොවියන්ගේ දෙනෙතෙහි රසඳුන් ගාන්නා සේය. දෑ කැති සිහිපත් කර වූ රන්වන් කරල් බිමට නැමුණේ ගොවියන්ගේ දහදිය උරුමය කැටි කරගෙනය. වපුළ රන් දහදිය බිඳු මිදී කරල් දෙපස ඇමිනුණේ වී ඇට බවට පත් කරමින් ය.ගිරා මලිති ආදී වී කුරුලු සමූහයක් කෙත් යායේ ඒ මේ අත සැරිසරමින් ප්‍රීතිඝෝෂා කරන්නට වූයේ කෙතට සෞන්දර්යය එක් කරමිනි.

(ගුරු මාර්ගෝපදේශයෙන් උපුටා ගන්නා ලදී)

අඳුනන කෙනෙකු හෝ නෑයෙකු එනවා දුටුවොත් කවදාවත් අහක බලාගෙන නොයනු.ඔවුනට සුදුසු විදියෙන් ආචාර කිරීම ඉතා හොඳ ගතියකි.එය ශීලාචාර ළමයින් ඇඳිනගන්නා ලක්ෂණයෙකි. ගුරුවරයා ඈත යනවා දුටුවොත් බිම හෝ අහක හෝ බලාගෙන නොයන්න.එසේ නිරීම ඉතා අශෝභන ය.

(ගුරු මාර්ගෝපදේශයෙන් උපුටා ගන්නා ලදී)

ක්‍රියාකාරකම 2

- රවුම් කරන ලද වචන පහත වගුව තුළ ලියමු.
- ශබ්ද නඟා කියවමු.

| ස | ශ | ෂ |
|---|---|---|
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |

- පෙළපොතේ 09 පාඩම "නුවණැති"නායකයා (පිටුඅංක 51-54) පාඩම ශබ්දනඟා කියවමු .
- එහි ඇති ස,ශ,ෂ යෙදුණු වචන රවුම් කරමු

අන්තර්ගතය : සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
සැකසුම : එස්.ඒ.රුවන් ලක්මාල් සමරතුංග - ර/මැටිහක්වල විද්‍යාලය - ඕපනායක